# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கைN 2017

# ANNUAL PERFORMANCE REPORT


පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

நன்னடத்தை, சிறுவர் பராமரிப்புச் சேவைகள் திணைக்களம்
பீ பிரிவு, 3 ஆம் மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.

**Department of Probation and Child Care Services**
**Section B, 3rd Floor, Stage II, Sethsiripaya, Battaramulla.**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2017

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**
**බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.**

## පෙළගැස්ම


1. **හැඳින්වීම** 5

1.1 දෙපාර්තමේන්තු ඉතිහාසය ........................................6

1.2 පළාත් සභා පිහිටුවීම සහ දෙපාර්තමේන්තුවේ බලතල........................7

1.3 අපගේ දැක්ම ........................................8

1.4 අපගේ මෙහෙවර ........................................8

1.5 අපගේ අගයයන් ........................................8

1.6 අපගේ කැපවීම ........................................9

1.7 වැඩසටහන් ........................................10

1.8 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යූහය හා කාර්ය මණ්ඩලය යෙදවීම ....................11

2. **ආයතන හා පරිපාලන අංශය** 13

2.1 ආයතන හා පරිපාලන අංශයේ මූලික කාර්යයභාරය........................14

2.2 පුහුණු වැඩසටහන්හා පර්යේෂණ ........................................15

2.2.1 ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් ........................15

**3. ගිණුම් අංශය 18**

3.1 මූල්‍ය ප්‍රගතිය ........................................19

3.2 විගණන නිරීක්ෂණය........................................21

**4. පරිවාස කටයුතු 22**

4.1 හැඳින්වීම ........................................23

4.2 දරුකමට හදාවඩා ගැනීම්........................................24

4.3 විදේශ හදාවඩා ගැනීම් සඳහා වෙන් කළ දරුවන් - 2017 ....................25

**5.සංවර්ධන අංශයේ කටයුතු 26**

5.1 හැඳින්වීම ........................................27

5.2 ළමුන්ගේ සමාජ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2017-2018 ............28

5.3 සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය ........................................29

5.4 දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා අධ්‍යාපන ආධාර..............29
5.5 කැපකරු දෙගුරු වැඩසටහන....................................................................30
5.6 නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය ......................................................32
5.7 නිවුන් දරු ආධාර...................................................................................33
5.8 වෛද්‍ය ආධාර........................................................................................35
5.9 හදිසි විපත් ආධාර..................................................................................36
5.10 සෙනෙහස ඉතිරි කිරීමේ ගිණුම ..........................................................38
5.11 ළමා සමාජ හා ළමා සභාව පිහිටුවීමේ ව්‍යාපෘතිය...........................................49
5.12 වීදි දරු සුභසාධන වැඩසටහන...................................................................45
5.13 ආදර්ශ ළමා ගම්මාන වැඩසටහන - 2017 ...................................................46
5.14 ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු වැඩසටහන ..............................47
5.15 ළමා මිතුරු මධ්‍යස්ථානය ......................................................................48
5.16 දැනුවත් කිරීමේ වැඩසටහන ....................................................................48
5.17 පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය.......................48
5.18 ළමා නිවාස ගුණාත්මක තත්වයෙන් ඉහළ නැංවීම .......................................49
5.19 ආයතනගත දරුවන්ගේ කුසලතා වර්ධනය ..................................................50
5.20 ළමා නිවාස අධීක්ෂණය ........................................................................50
5.21 යුනිසෙෆ් ව්‍යාපෘතිය ...........................................................................50
5.22 2017 ලෝක ළමා දිනය .........................................................................51
5.23 ළමා අපයෝජන පැමිණිලි පිළිබඳ තොරතුරු ..............................................51
5.24 ආරක්ෂණ සැළසුම් සකස් කිරීම ............................................................53
5.25 ළමා මූලික පර්යේෂණය ........................................................................55
5.26 ළමා හිංසනය පිටු දැකීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සංවිධානය.........56
5.27 කොමන් බෝන්ඩ් ව්‍යාපෘතිය සඳහා ළමා සමාජ නියෝජිතයන් යොමු කිරීම….56
5.28 උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම....57

# 1. හැඳින්වීම

2017 වර්ෂයේ දී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද සේවාවන් මෙම වාර්තාවෙන් සමාලෝචනය කෙරේ.

## 1.1 දෙපාර්තමේන්තු ඉතිහාසය

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වලදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. 1907 දී එංගලන්තයේ සම්මත කරන ලද වරදකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත ලංකා අධිකරණය කෙරේ ද බලපෑවේය. වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත ඉහත සඳහන් කළ බලපෑම් වල ප්‍රතිඵලයක් විය. මෙම ආඥා පනත තුලින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත විය.එංගලන්තයේ පරිවාස සේවාව ඇසුරින් ලංකාවේ ද පරිවාස සේවාවන් ආරම්භ කිරීමේ කාර්යභාරය එංගලන්තයේ උපදේශකයෙකු වන එච්.ඒ.ලීඩීන් මහතාට පැවරුණු අතර, ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරීන් කීපදෙනෙකුගෙන් ආරම්භ විය. අත්හදා බැලීමක් ලෙස දිවයිනේ අධිකරණ කොට්ඨාශ කීපයක පමණක් ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම සේවය අධිකරණය විසින් පිළිගනු ලැබීය. ඉන්පසු එය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද ඉස්මතු විය.

1949 දී විනිශ්චයකාර ග්‍රේෂියන් මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ රජය විසින් පිළිගනු ලැබීමත් සමඟ දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරිණ. මෙම සේවාවේ පරිපාලන කටයුතු කරන ලද්දේ බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තුව විසිනි.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමඟම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරීමේ වැදගත්කම පිළිබඳව සිරිල් හැම්ලින් මහතාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. එම නිර්දේශය අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය.

මෙසේ 1956 දී ආරම්භ වූ දෙපාර්තමේන්තුව මුලින්ම සමාජ සේවා අමාත්‍යාංශය යටතට පත්විය. පසුව පත් වූ රජයන් විසින් වරින් වර විවිධ අමාත්‍යාංශ යටතට පත් කරන ලදී. 1990 වසර ආරම්භයේ දී එය ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 1994 අගෝස්තු මාසයෙන් පසුව සෞඛ්‍ය මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ද, 2001 වර්ෂයේ දි සමාජ සේවා හා ධීවර ප්‍රජාවගේ නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද, 2002 දී සෞඛ්‍ය පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2003 දී සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2004 වර්ෂයේ දී කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2005 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ද කටයුතු සිදු කෙරිණි. 2010 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2015 සිට මේ දක්වා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ද දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කෙරේ.

## 1.2 පළාත් සභා පිහිටුවීම සහ දෙපාර්තමේන්තුවේ බලතල

පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු, රැඳවුම් නිවාස, සහතික කළ පාසැල්, පරිවාස කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වල කටයුතු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාප්ත වූ අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර කොමසාරිස්වරුන් ද පරිවාස හා ළමාරක්‍ෂක සේවා කොමසාරිස්ට සහායවීම සඳහා පත් කෙරිණි.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ එම ව්‍යුහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්‍ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස්ට සහාය වීම සඳහා පත්කර සිටි සහකාර කොමසාරිස් තනතුරුද අහෝසි විය.පළාත් සභා යටතේ පළාත් පරිවාස හා  ළමාරක්‍ෂක සේවා කොමසාරිස්වරුන් සියළු පළාත් වෙනුවෙන් පත් වූ අතර පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්‍ෂණයට යටත් විය.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට අත්සන් තැබූ අතර 1992 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලදී. එම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි වූ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරිමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1999 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් ලෙස සිය ක්ෂේත්‍ර රාජකාරී ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් නව තනතුරක් නිර්මාණය කර ඊට නිලධාරීන් බඳවා ගන්නා ලදී. මේ වන විට මෙම නිලධාරීන් දිවයින පුරාම පිහිටි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව කටයුතු කරනු ලබයි. මෙමගින් පරිවාස විෂයය මෙන්ම ළමාරක්‍ෂක විෂයයටද මූලිකත්වය ලබාදී වැඩසටහන් දියත් කෙරේ.

## 1.3 අපගේ දැක්ම

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

## 1.4 අපගේ මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියළුම ළමුන් ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කරදීම.

## 1.5 අපගේ අගයයන්

- ❖ දරුවා කේන්ද්‍ර කොට ගැනීම
- ❖ දයාව / කරුණාව පෙරදැරි කර ගැනීම
- ❖ සහයෝගී ප්‍රවේශය
- ❖ මනා කැපවීම
- ❖ සංහිඳියාව

## 1.6 අපගේ කැපවීම

- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියා මාර්ග ගැනීම
- නීතිමය ගැටලු වලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාල අමාත්‍යාංශ හා පළාත් සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වලට අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම
- පවතින අභ්‍යන්තර වත්කම් හා කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම
- කාර්යක්ෂමව ළමා අයිතිවාසිකම් සුරැකීමට හැකි මනා කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම

## 1.7 වැඩසටහන්

- ❖ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- ❖ විදේශීය හදාවඩා ගැනීම්
- ❖ ළමුන් ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන්
    - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය මඟින් අසරණ ළමයින්ට අවශ්‍ය සහන සැලසීම
    - නැණ දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහන ක්‍රියාත්මක කිරීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය මඟින් ළමයින්ට අධ්‍යාපන ආධාර ලබා දීම
- ❖ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් සමාජ ව්‍යුහයන් බල ගැන්වීම
- ❖ ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා සමාජ හා ළමා සභා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ❖ පුහුණු හා පර්යේෂණ කටයුතු
- ❖ උපදේශනය අවශ්‍ය, නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් වෙනුවෙන් පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

## 1.8 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලය යෙදවීම

ශ්‍රී.ලං.ප.සේවයට අයත් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙක්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරයකු, ගණකාධිකාරීවරයෙකු, නීති නිළධාරියකු, පරිපාලන නිලධාරී වරයෙකු, පරිවාස නිලධාරීන් දෙදෙනෙකු, සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් දෙසිය තිස්දෙදෙනෙකු ගෙන් සමන්විත මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලයකගේ සහාය ඇතිව කොමසාරිස් විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම දරනු ලැබේ.

සංවිධාන ව්‍යුහයට අයත් වන අංශ :-

1. ආයතන හා පරිපාලන අංශය
2. ගිණුම් අංශය
3. පරිවාස අංශය
4. සංවර්ධන අංශය
5. පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය උපරිම කැපවීමෙන් යුතුව කටයුතු කරනු ලැබේ. සමස්ත කාර්ය මණ්ඩලය 487 ක් වන අතර දැනට එය පහත සඳහන් පරිදි 447 දෙනෙකුගෙන් සමන්විත වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ. – I) | 01 | 01 |
| නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ. II/III) | 02 | 01 |
| සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | 01 | - |
| ගණකාධිකාරී | 01 | 01 |
| නීති නිළධාරී | 01 | - |
| පරිපාලන නිලධාරී | 01 | - |
| භාෂා පරිවර්තක | 02 | 01 |
| පරිවාස නිලධාරී | 02 | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 01 | 01 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී (CRPO) | 424 | 232 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර (CRPA) | | 168 |
| සංවර්ධන නිලධාරි (ප්‍රධාන කාර්යාලය/පරත්ත) | 12 | 08 |
| මනෝ උපදේශක | 02 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 14 | 14 |
| ලඝු ලේඛක | 01 | 00 |
| නොවිධිමත් අධ්‍යාපන උපදේශිකා | 01 | 01 |
| සහකාර වෝර්ඩන් | 03 | 03 |
| රියදුරු | 04 | 04 |
| කාර්යාල සේවක සේවය | 10 | 08 |
| අරක්කැමි | 02 | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 | - |
| මුළු එකතුව | 487 | 447 |

# 2. ආයතන හා පරිපාලන අංශය

## 2.1 ආයතන හා පරිපාලන අංශයේ මූලික කාර්යයභාරය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අදාල ආයතන කටයුතු

- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අදාල නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාන මාරු කිරීම සහ විනය සම්බන්ධ කටයුතු
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩඉම් සහ ප්‍රවීණතා පරීක්ෂණ පැවැත්වීම
- සියළුම කාර්ය මණ්ඩලයට ක්‍රමවත් පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේ දී අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ පවත්නා දැනුම වඩාත් වර්ධනය කිරීමටත්, නව සංවර්ධන ක්‍රමෝපායන් හඳුන්වාදීමටත්, නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුවීම් හා දැනුම ලබා දීමටත් කටයුතු කරන ලදි. ඒ අනුව,.

- ආයතන කටයුතු ,මූල්‍ය හා ගිණුම් කටයුතු පිලිබඳ පුහුණුවීම් සහ සේවක අභිප්‍රේරණ පුහුණු කටයුතු සඳහා රු. 171,500/- ක මුදලක් වෙන් කෙරුනි.

| පුහුණු වැඩ සටහනේ නම | වැය වූ මුදල |
|---|---|
| කාර්යාල හා කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 12000.00 |
| සේවක අභිප්‍රේරණ වැඩ සටහන | 132500.00 |
| දෙමළ භාෂා අධ්‍යයන පුහුණු පාඨමාලාව | 10500.00 |
| පරිගණක වැටුප් සැකසීමේ පාඨමාලාව | 16500.00 |
| එකතුව | 171500.00 |

- දෙපාර්තමේන්තුගත නිලධාරීන් ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් ගේ පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු වලින් 50% - 75 % දක්වා මුදලක් ගෙවීමට කටයුතු කෙරිනි. ඒ සඳහා රු. 306,600/- ක මුදලක් වෙන් කෙරුනි.

| උපාධි/පුහුණු වැඩ සටහනේ නම | වැය වූ මුදල රු. |
| --- | --- |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 142100.00 |
| ඉංග්‍රීසි භාෂා අධ්‍යයන පුහුණු පාඨමාලාව (Preliminary Level) | 17500.00 |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 56000.00 |
| සමාජ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව | 16000.00 |
| උපදේශනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව | 70000.00 |
| එකතුව | 306600.00 |

## 2.2 පුහුණු වැඩසටහන් හා පර්යේෂණ

### 2.2.1 ක්ෂේත්‍ර නිලධාරින්ගේ පුහුණු වැඩසටහන්

ළමා අපයෝජන තත්ත්වයන් අවම කරමින් ළමුන්ට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් සිටී.

මෙම වැඩ සටහන් ශ්‍රී ලාංකික ළමා පරපුරේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම පිණිස ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා ප්‍රමාණවත් දැනුමක් සහිත නිලධාරීන් පිරිසක් සේවයේ යෙදවීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් හා සහකාර නිලධාරින් සේවයේ යෙදී සිටී.

මෙම නිලධාරින්ට ක්ෂේත්‍රයේ ළමයින් සම්බන්ධව කටයුතු කිරීමේ දී පවතින දැනුම ප්‍රමාණවත් නොවීම හා නිරන්තරව යාවත්කාලීන විය යුතු බැවින් හා නිලධාරින්ගේ කුසලතා , ආකල්ප, ඵලදායීව මෙහෙයවීම සඳහා ද පුහුණුවීම් ලබා දීම සිදු කළයුතුව ඇත. ඒ උදෙසා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය මගින් 2017 වසරේ දී පුහුණු වැඩ සටහන් සංවිධානය කර පවත්වන ලදී.

වැය ශීර්ෂය - 217-2-2-2401

අනුමත ප්‍රතිපාදන - රු.700000.00

| පුහුණු වැඩ සටහනේ නම | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය | වියදම රු. | විෂය මාතෘකා |
|---|---|---|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී පුහුණු වැඩ සටහන | 24 | 2017.04.24 - 26 | 115286.00 | • නව යොවුන් වියේ ළමයින්ගේ ජීවන කුසලතා<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• ළමුන් සමඟ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් භාවිතය<br>• සමාජ වැඩ හා ව්‍යාපෘති සැකසීම |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී පුහුණු වැඩසටහන (ද්‍රවිඩ මාධ්‍යය | 28 | 2017.07.11 -13 | 131035.00 | • නව යොවුන් වියේ ළමයින්ගේ ජීවන කුසලතා<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• ළමුන් සමඟ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් භාවිතය<br>• සමාජ වැඩ හා ව්‍යාපෘති සැකසීම |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී පුහුණු වැඩසටහන | 21 | 2017.07.25 – 27 | 98780.00 | • නව යොවුන් වියේ ළමයින්ගේ ජීවන කුසලතා<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• ළමුන් සමඟ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් භාවිතය<br>• සමාජ වැඩ හා ව්‍යාපෘති සැකසීම |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරී පුහුණු වැඩසටහන | 22 | 2017.08.23 – 25 | 103917.00 | • නව යොවුන් වියේ ළමයින්ගේ ජීවන කුසලතා<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• ළමුන් සමඟ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් භාවිතය<br>• සමාජ වැඩ හා ව්‍යාපෘති සැකසීම |
| ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සංස්කරණ සම්මේලනය | 290 | 2017.12.08 | 203250.00 | • නව යොවුන් වියේ ළමයින්ගේ ජීවන කුසලතා<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• ළමුන් සමඟ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් භාවිතය<br>• සමාජ වැඩ හා ව්‍යාපෘති සැකසීම |

## ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි සම්පත්දායක සංචිතය

| පුහුණු වැඩ සටහන | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය | පැවැත් වූ ස්ථානය | වියදම රු. |
|---|---|---|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී සම්පත්දායක සංචිතය (සිංහල මාධ්‍යය) | 40 | 2017.06.13 - 16 | SDFL ආයතනය | 360775.00 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී සම්පත්දායක සංචිතය (ද්‍රවිඩ මාධ්‍යය) | 16 | 2017.10.09 - 12 | NTRC ආයතනය | 3080034.00 |

# 3. ගිණුම් අංශය

දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වාර්ෂිකව රාජ්‍ය අයවැය ලේඛනය මඟින් සපයා දෙනු ලබයි. 2017 වසරේදී 217 වැය ශීර්ෂය යටතේ යටතේ ප්‍රතිපාදන සපයා ඇත .

මෙම ප්‍රතිපාදන වෙන් කිරීම වැඩසටහන් දෙකකින් සමන්විතය.

1. මෙහෙයුම් වැඩසටහන
2. සංවර්ධන වැඩසටහන

ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

## 3.1 මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන් වශයෙන් ප්‍රතිපාදන / වියදම් සාරාංශය | | | | |
|---|---|---|---|---|
| 01. මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % |
| | 1. පුනරාවර්තන වියදම් | 35,187700.00 | 33,474,416.00 | 95% |
| | 2. මූලධන වියදම් | 850,000.00 | 653,100.00 | 76% |
| | එකතුව | 36,037,700.00 | 34,127,516.00 | |
| 02. සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්ෂක සේවා | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | |
| | 1. පුනරාවර්තන වියදම් | 255,875,000.00 | 252,475,404.00 | 98% |
| | 2. මූලධන වියදම් | 17,750,000.00 | 16,730,947.00 | 94% |
| | එකතුව | 273,625,000.00 | 269,206,351.00 | |

| මූල ධන වියදම් ප්‍රතිපාදන / වියදම් සාරාංශය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | හැකියා වර්ධනය | | | ළමා නිවාස පුනරුත්තාපනය කිරීම/ළමා නිවාස අධීක්ෂණය / ළමා නිවාස දරුවන්ගේ වෘත්තිමය පුහුණු හැකියා වර්ධනය | | |
| 1. මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % |
| | 200,000.00 | 171,500.00 | 85% | --- | --- | - |
| 2. සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්ෂක සේවා | 1,000,000.00 | 927,287.00 | 92% | 15,000,000.00 | 14,414,198.00 | 96% |
| එකතුව | 1,200,000.00 | 1,098,787.00 | | 15,000,000.00 | 14,414,198.00 | |

| මූල ධන වියදම් ප්‍රතිපාදන / වියදම් සාරාංශය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | මූලධන වත්කම් අත්පත් කරගැනීම | | |
| 01. මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % |
| | 250,000.00 | 118,200.00 | 47% | 400,000.00 | 363,400.00 | 90% |
| 02. සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්‍ෂක සේවා | 750,000.00 | 428,650.00 | 79% | 1,000,000.00 | 960,813.00 | 93% |
| එකතුව | 1,000,000.00 | 546,850.00 | | 1,400,000.00 | 1,324,213.00 | |

## 3.2 විගණන නිරීක්ෂණය

මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන පරිදි පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හා ගණන් දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

# 4. පරිවාස කටයුතු

## 4.1 හැඳින්වීම

පරිවාස සේවය යනුවෙන් අදහස් කරනුයේ ආයතනගත කිරීමක්, සිරගත කිරීමක්, වෙනත් මූල්‍යමය දඩයකට හෝ වෙනත් දණ්ඩනයකට යටත් කිරීමකින් තොරව වරදකරුවෙකු පුනරුත්ථාපනය කිරීමයි. හුදෙක් එමඟින් අපේක්ෂා කරනුයේ පුද්ගලයා ජීවත්වන පරිසරයේම ඉන්නට ඉඩහැර පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඔහුට සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් වැළකී නව ජීවිතයක් ගොඩනඟා ගැනීමට අවස්ථාව ලබාදීමයි.

1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනතේ 03 වන වගන්තිය අනුව කිසියම් වරදක ස්වභාවය අනුවද වරදකරුවාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ඔහුගේ තත්වය යන කරුණු ද අධිකරණය මගින් සැලකිල්ලට ගෙන ඕනෑම පුද්ගලයෙකු වරදකරුවෙකු යැයි තීරණය කිරීමෙන් අනතුරුව ඔහුගේ කැමැත්ත ද ඇතිව ඕනෑම වරදක් සම්බන්ධයෙන් පරිවාස නියෝගයක් පැනවිය හැකිය.

මෙසේ පරිවාස භාරයට යොමු කිරීමෙන් වරදකරුට ආර්ථික හා සාමාජීය වශයෙන් ප්‍රතිලාභ හිමිවන අතරම එය මුළු මහත් සමාජයටම ද ප්‍රතිලාභ ගෙන දෙන්නකි. උදාහරණයක් ලෙසට යම් පුද්ගලයෙකු කිසියම් වරදක් කොට ඔහු සිරභාරයට හෝ වෙනත් දඬුවමකට ලක් කලහොත් එය ඔහුගේ පවුලට ආර්ථික හා සාමාජීය වශයෙන් බලපානු ලබයි. එසේම රටට ද එවැනි අයෙකු නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. එහෙත් එම පුද්ගලයා ජීවත්වන පරිසරය තුල තබා ඔහුගේ එදිනෙදා ජීවිතය යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමට උපදෙස් පරිවාස සේවයෙන් හිමිවේ. එබැවින් මෙම පරිවාස සේවය ප්‍රජාපාදක පුනරුත්ථාපන ක්‍රියාවලියක් ලෙසට මුළු ලෝකයම පිළිගෙන ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය පළාත් සභා වෙත පැවරී ඇතත් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම මධ්‍යම රජය යටතේ දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. එබැවින් පරිවාස සේවය විමධ්‍යගත වුවද අදාල ප්‍රතිපත්ති හා පනත් සංශෝධනය කිරීම මධ්‍යම රජයේ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයකි. ඒ අනුව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් පරිවාස සේවය වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදි. දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම යටතේ පළාත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම හා එකී ප්‍රගති සමාලෝචනය ද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.

## 4.2 දරුකමට හදාවඩා ගැනීම්

1941 අංක 24 දරුකමට හදාවඩා ගැනීමේ ආඥා පනත යටතේ හදාවඩා ගැනීමට යෝජිත දරුවන්ගේ නීත්‍යානුකූල භාරකරු ලෙස ක්‍රියා කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. මෙම කාර්යභාරය දේශීය හා විදේශීය වශයෙන් කොටස් දෙකකට බෙදේ. මෙයින් දේශීය හදාවඩා ගැනීම් පළාත් කොමසාරිස් විසින් කරනු ලබන අතර විදේශීය හදාවඩා ගැනීම් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ උපත ලබා එහෙත් වර්තමානයේ නොයෙක් විදේශ රටවල පුරවැසි භාවය ලබා සිටින්නවුන්, ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල ද්විත්ව පුරවැසිභාවය හිමි අය හා තාවකාලිකව වෙනත් රටවල ජීවත් වන පුද්ගලයන් ද දරුවන් හදාවඩා ගැනීම සඳහා සිය ඉල්ලුම්පත් මධ්‍යම රජයේ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි. එම ඉල්ලුම්කරුවන් දරුවන් රටින් බැහැරට ගෙන යන බැවින් ඔවුන් විදේශ හදාවඩා ගැනීමේ නීතිරීති අනුගමනය කළයුතු වේ.

තවද විදේශ රටවල ජීවත් වන ඇතැම් ඉල්ලුම්කරුවන් තම පවුලේ ඥාති දරුවන් හදාවඩා ගැනීමට ඉදිරිපත් වන අවස්ථා ඇති අතරම ඔවුන්ටද විදේශ හදාවඩා ගැනීමේ උපදෙස් පිළිපැදීමට සිදුවේ. එසේම විදේශිකයන්ද ශ්‍රී ලාංකික දරුවන් දරුකමට හදා වඩා ගැනීමට සිය ඉල්ලුම්පත්‍ර පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. අන්තර් ජාතික හේග් සම්මුතියේ හා ළමුන් දරුකමට හදා වඩා ගැනීමේ ආඥා පනතේ නීති ප්‍රතිපාදන මත එම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරනු ලැබේ. දේශීය ඉල්ලුම්කරුවන් නොමැති ළමුන් විදේශ හදා වඩා ගැනීම සඳහා යොමු කරනු ලැබේ.

## 4.3 විදේශ හදාවඩා ගැනීම් සඳහා වෙන් කළ දරුවන් - 2017

| අංක | විදේශිය රට | විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් විසින් හදාවඩා ගැනීමට ගත් දරුවන් සංඛ්‍යාව | විදේශ හදාවඩා ගැනීම් | හදාවඩා ගැනීමට දුන් මුළු දරුවන් ගණන |
|---|---|---|---|---|
| **01** | ජර්මනිය | - | 04 | 04 |
| **02** | කැනඩා | 01 | - | 01 |
| **03** | ප්‍රංශය | - | 02 | 02 |
| **04** | එක්සත් රාජ්‍ය | 03 | - | 03 |
| **05** | නෙදර්ලන්තය | - | 01 | 01 |
| | එකතුව | 04 | 07 | 11 |

# 5. සංවර්ධන අංශයේ කටයුතු

## 5.1 හැඳින්වීම

ළමයා කෙරෙහි විශේෂ රැකවරණය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය

- 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයෙහි
- 1959 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන් විසින් සම්මත කරනු ලැබූ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි
- 1976 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි
- 1976 ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි
- 1991 ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි

ළමයින්ගේ සුභසාධනය පිළිබඳ ප්‍රවේදිතාවක් ඇත්තාවූ විශේෂිත අනුයෝජිතායතනවල සහ ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථා සහ අදාළ සාධන පත්‍රවල පිළිගනු ලැබ ඇත්තා වූ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ප්‍රකාශ කොට ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් පිළිගන්නා නීති සහ ප්‍රතිපත්ති සඳහා විධි විධාන සැලසිය යුතු හෙයින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කර ඇත. එකී ප්‍රඥප්තියෙහි විධි විධාන ආවරණය වන පරිද්දෙන් දෙපාර්තමේන්තුව විසින් පහත දක්වා ඇති ආකාරයට සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

1. ජීවත්වීමට හා සංවර්ධනයට ඇති අයිතිවාසිකම් සහතික කිරිම යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන
    - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය
    - අධ්‍යාපන ආධාර ලබා දීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය
    - නැණ දිරිය අධ්‍යාපන ආධාර ලබා දීම
    - හදිසි විපත් / වෛද්‍යාධාර / නිවුන් දරු ආධාර ක්‍රම
    - සෙනෙහස ආධාර ක්‍රමය

2. ළමා සහභාගීත්වය තහවුරු කිරීම යටතේ සිදු කරන ලද වැඩසටහන්
    - ළමා සමාජ හා ළමා සභා ස්ථාපිත කිරීම
    - ලෝක ළමා දිනය පිළිබඳ වැඩසටහන්

3. ප්‍රජා මූලික ළමා ආරක්ෂණය යටතේ සිදු කරන ලද වැඩසටහන්

- ආදර්ශ ගම්මාන, සුභසාධක ගම්මාන හා ප්‍රජා මූලික ගම්මාන පිහිටුවීම
- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳ මෙහෙයුම් කමිටු පැවැත්වීම
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

4. විකල්ප ආරක්ෂණය යටතේ සිදු කරන ලද වැඩසටහන්

- අපයෝජනයට පත් දරුවන් පුනරුත්ථාපනය කිරීම
- ආයතනගත ළමුන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම
- ආයතනගත ළමුන්ගේ හැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

## 5.2 ළමුන්ගේ සමාජ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම - 2017 – 2018

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ළමා රැකවරණ ආයතනයේ (Save the Children ) මූල්‍ය ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා ළමා ලේකම් කාර්යාලය එක්ව ළමුන්ගේ සමාජ ආරක්ෂාව සඳහා වන ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට වගකීම් පවරනු ලැබ ඇත.

ළමා රැකවරණ ආයතනය ( Save the Children ) මූලික ක්ෂේත්‍ර 04ක් ඔස්සේ ළමුන්ගේ ආරක්ෂාව සංවර්ධනය හා සහභාගීත්වය යන අයිතීන් ලාංකික සමාජය තුළ ශක්තිමත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය තුළින් මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබේ.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත සුවිශේෂිත වගකීමක් 2017 වර්ෂයේ පවරනු ලැබ ඇත. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව වෙත රු.මි. 97.22 ප්‍රතිපාදන මුදලක් වෙන්කරන ලද අතර 2017 වර්ෂය සඳහා වෙන් කරන ලද මෙම ප්‍රතිපාදන මුදල් පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් යොදවන ලදී.

අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම තුළින් එම දරුවන්ගේ අවදානම් තත්වයන් වළක්වා ඔවුන්ගේ ආරක්ෂාව සංවර්ධනය තහවුරු කිරීම, හඳුනා ගනු ලැබූ සුවිශේෂිත ගැටළු සඳහා පර්යේෂණ සිදු කිරීම ඒ යටතේ මව් වරුන් විදේශගතවීම දරුවන්ගේ සංවර්ධනය හා ආරක්ෂාව සඳහා කරනු ලබන බලපෑම පිළිබඳවත්, ළමුන්ගේ සහභාගීත්ව අයිතිය සහතික කිරීම සඳහා නිර්මාණය කරන ලද ළමා සමාජ හා ළමා සභා පිළිබඳවත් පර්යේෂණයන් 02ක් සිදු කරන ලදී.

ළමා ආරක්ෂාව ශක්තිමත් කිරිම සඳහා සමාජ ව්‍යුහයන් ශක්තිමත් කිරීම සඳහා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු මාර්ගෝපදේශ සංග්‍රහය මුද්‍රණය කර ලංකාව පුරා බෙදාහැර කමිටු සාමාජිකයන් පුහුණු කිරීම සිදු කර ඇත. ළමා අපයෝජන වැලැක්වීම සඳහා සිද්ධි කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කරන ලද අතර එය මේ වනවිට අවසන් අදියරේ පවතී.

ළමා ආරක්ෂාව හා ළමා අයිතිවාසිකම් ප්‍රචලිත කිරීම සඳහා ජාතික මට්ටමේ දැනුවත් කිරීම් වැඩසටහන් වෙනුවෙන් වීඩියෝ පටයක් නිර්මාණය කිරීමද මේ යටතේ සිදු කර ඇත. ළමුන්ගේ සාමාජ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම තුළින් ලාංකික ළමුන්ගේ ආරක්ෂාව සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ළමුන්ට වඩාත් සුදුසු සමාජ පරිසරයක් නිර්මාණය කිරීමට සුවිශේෂිත දායකත්වයක් දක්වනු ලබන බව ඉතා පැහැදිලි කාරණයකි.

## 5.3 සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය

මෙම වැඩසටහන තුළින් ආර්ථික අපහසුතා මැද අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ඉගෙනුම් අවශ්‍යතා සපයා ගැනීමට අවශ්‍ය පරිදි මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙනු ඇත. මේ සඳහා මූල්‍ය දායකත්වය කැපකරු මාපියන් ගෙනි.

| වර්ෂය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය ( මිලියන ) |
| --- | --- | --- | --- |
| **2017** | සෙවණ සරණ අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය | 75 | 1.6 |

## 5.4 දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා අධ්‍යාපන අධාර ලබා දීම

සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලබා ගැනීමට අයිතිවාසිකමක් ඇති අතරම ළමා සංවර්ධනයේ දී එය ඉතා වැදගත් සාධකයකි. ළමා කාලය තුල අධ්‍යාපන අවස්ථාව අහිමි වුවහොත් ළමුන්ගේ අනාගතය අඳුරු විය හැකිය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය අතරමග නතර කරන ළමුන් නිසා ළමා ශ්‍රමිකයන්, ළමා මව්වරුන් බිහිවීම හා විවිධ අපයෝජන වලට ළමුන් ලක්වන අවස්ථා බහුල වී ඇත. දෙමාපියන් අහිමිවීම, දෙමාපියන්ගේ නොදැනුවත්කම, නොසැළකිල්ල, මව විදේශගතවීම, ආර්ථික දුෂ්කරතා ආදී විවිධ කරුණු මත ළමුන්ගේ පාසැල් අධ්‍යාපනය අතරමග නතරවීම සිදුවනු ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම තුලින් සදාචාරවත් දරු පරපුරක් බිහි කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙහිදි ප්‍රවේශ 2 ක් යටතේ දරුවන්ට උපකාර කරනු ලැබේ. ඔවුන් නම්,

- පාසල් අධ්‍යාපනය ලබන වයසේ පසු වුවත් ආර්ථික දූෂ්කරතා නිසා අතරමග අධ්‍යාපනය නවතා දමා ඇති හෝ නතර විය හැකි දරුවන්
- විවිධ හේතූන් මත කඩින් කඩ පාසල් යන දරුවන් ය.

පාසල් නොයන දරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන ඔවුන්ගේ පාසල් නොයාමට හේතුව සොයා බලා ඊට අවශ්‍ය කටයුතු සිදු කර ඔවුන්ව පාසල් ගත කිරීමත්, උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ කරන ලද වතු ආශ්‍රිත ළමයින්ගේ අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා පාසල් උපකරණ ලබාදීමත් මෙමඟින් සිදු  කරන ලදී.

මෙම වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක කරන ලදී

- පාසල් උපකරණ ලබාදී ඔවුන් ශක්තිමත් කිරීම.
- අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම ගැන දරුවන්, ගුරුවරුන්, දෙමාපියන් සඳහා දැනුවත් කිරීම වැඩසටහන් කිරීම.
- විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් නිලධාරීන් අතර දරුවාට යහපත් වන පරිදි මනා සම්බන්ධීකරණයක් ගොඩ නැගීම.


ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටින ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

## 5.5 කැපකරු දෙගුරු වැඩසටහන

තවදුරටත් දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා උදෙසා සහයෝගය දෙනු ලබන වැඩසටහනක් ලෙස කැපකරු දෙගුරු වැඩසටහන හඳුන්වා දිය හැකිය. මෙය මාසිකව ලබා දෙනු ලබන අධ්‍යාපනික ශිෂ්‍යත්ව ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. සුවිශේෂී  අධ්‍යාපනික දක්ෂතා ඇති ආර්ථික වශයෙන් අගහිඟකම් මැද ජීවත්වන පාසල් දරුවන් මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වේ. මොවුන්ගේ තෝරා ගැනීම හා යොමු කිරීම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හරහා සිදු කරනු ලබන අතර, මාසයකට රු. 500/-ක හෝ රු. 750/- ක මුදලක් එක් දරුවෙකු වෙනුවෙන් ලබා දීමට කටයුතු කෙර

**2017 වර්ෂයේ කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර ගෙවීම්**

| | දිස්ත්‍රික්කය | ළමුන් ගණන | මුදල |
|---|---|---|---|
| **1.** | කොළඹ | 79 | 474000.00 |
| **2.** | ගම්පහ | 96 | 549000.00 |
| **3.** | කළුතර | 82 | 471000.00 |
| **4.** | ගාල්ල | 126 | 747000.00 |
| **5.** | මාතර | 105 | 756000.00 |
| **6.** | හම්බන්තොට | 119 | 672000.00 |
| **7.** | මහනුවර | 165 | 942000.00 |
| **8.** | මාතලේ | 63 | 390000.00 |
| **9.** | නුවරඑළිය | 17 | 120000.00 |
| **10.** | අනුරාධපුරය | 151 | 912000.00 |
| **11.** | පොළොන්නරුව | 12 | 81000.00 |
| **12.** | මොණරාගල | 82 | 438000.00 |
| **13.** | බදුල්ල | 143 | 807000.00 |
| **14.** | කුරුණෑගල | 202 | 1203000.00 |
| **15.** | පුත්තලම | 52 | 300000.00 |
| **16.** | කෑගල්ල | 97 | 540000.00 |
| **17.** | රත්නපුරය | 93 | 546000.00 |
| **18.** | මුලතිව් | 01 | 6000.00 |
| **19.** | ත්‍රිකුණාමලය | 12 | 72000.00 |
| **20.** | මන්නාරම | 02 | 12000.00 |
| **21.** | මඩකලපුව | 28 | 159000.00 |
| **22.** | වවුනියාව | 01 | 12000.00 |
| **23.** | කිළිනොච්චිය | 01 | 6000.00 |
| **24.** | අම්පාර | 15 | 147000.00 |
| **25.** | යාපනය | 96 | 543000.00 |
| | එකතුව | 1840 | 10845000.00 |




## 5.6 නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය

නැණ දිරිය වැඩසටහන සඳහා ද පෞද්ගලික අංශයේ මූල්‍ය දායකත්වය මත මෙම දෙපාර්තමේන්තුවේ කළමණාකරණ මණ්ඩලයක් මඟින් විවිධ හේතු මත අධ්‍යාපනය අහිමි වීමේ අවදානමට පත් වී ඇති දරුවන් සඳහා මාසික ශිෂ්‍යත්වයක් පිරිනැමේ. මෙම වැඩසටහන ද සෙවණ සරණ කැපකරු මා පිය ක්‍රමය යටතේ උප ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ. මෙමගින් එක් දරුවකුට මසකට රු. 1000/- ත් රු. 2000/- ත් අතර මුදලක් අනුග්‍රාහකයාගේ කැමැත්ත අනුව ලබා දෙනු ඇත.

**නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය**

| වර්ෂය | වැඩ සටහන | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| **2017** | නැණ දිරිය අධ්‍යාපන ආධාර වැඩ සටහන | 550 | මි.6.6 |

## 5.7 නිවුන් දරු ආධාර


අඩු ආදායම්ලාභී පවුල්වල නිවුන් දරුවන්ගේ සෞඛ්‍ය, පෝෂණය හා අනෙකුත් සුභසාධන කටයුතු වෙනුවෙන් මෙන්ම එම දරුවන් අවදානම් තත්වයන්ගෙන් ආරක්‍ෂා කර ගැනීම පිණිස ලබා දෙන ආධාර ක්‍රමයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දිම මෙහිදී සිදුවේ.

මේ යටතේ දරුවන් දෙදෙනෙකු සඳහා රු.7500/- ක්ද තුන් දෙනෙකු වෙනුවෙන් රු.15,000/- ක් ද සිව් දෙනෙකු සඳහා රු.20,000/- ක් ද පස් දෙනෙකු වෙනුවෙන් රු.25,000/- ක් ද වශයෙන් මුදල් ගෙවීම් සිදු කරයි.

සෑම ඉල්ලුම් කරුවෙකුටම එක් අවස්ථාවක් පමණක් මෙම ආධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව වසරකට පවුල් 500 කට වැඩි පිරිසකට මෙමඟින් සහන සලසා දීමට අවස්ථාව උදා වී ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ළමුන් ගණන | මුදල රු. |
|---|---|---|---|
| 01 | කොළඹ | 05 | 20000.00 |
| 02 | ගම්පහ | 10 | 37500.00 |
| 03 | මාතර | 13 | 52500.00 |
| 04 | ගාල්ල | 08 | 30000.00 |
| 05 | හම්බන්තොට | 11 | 45000.00 |
| 06 | මහනුවර | 15 | 70500.00 |
| 07 | මාතලේ | 11 | 45000.00 |
| 08 | නුවරඑළිය | 10 | 37500.00 |
| 09 | අනුරාධපුරය | 06 | 22500.00 |
| 10 | පොලොන්නරුව | 02 | 7500.00 |

| | | | |
|---|---|---|---|
| **11** | මොණරාගල | 11 | 45000.00 |
| **12** | බදුල්ල | 11 | 45000.00 |
| **13** | කුරුණෑගල | 21 | 82500.00 |
| **14** | පුත්තලම | 09 | 37500.00 |
| **15** | කෑගල්ල | 12 | 45000.00 |
| **16** | රත්නපුරය | 14 | 52500.00 |
| **17** | **මුලතිව්** | 04 | 15000.00 |
| **18** | **ත්‍රිකුණාමලය** | 06 | 22500.00 |
| **19** | මඩකලපුව | 14 | 52500.00 |
| **20** | වවුනියාව | 02 | 7500.00 |
| **21** | අම්පාර | 16 | 60000.00 |
| **22** | යාපනය | 14 | 52500.00 |
| **23** | මන්නාරම | 02 | 7500.00 |
| | එකතුව | 227 | 893000 |



## 5.8 වෛද්‍ය ආධාර

අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ ගැටළු සඳහා සහන සැපයීම වෙනුවෙන් මෙම ආධාර ක්‍රමය ක්‍රියාත්මක වේ. එසේම ආබාධිත දරුවන් වෙනුවෙන් ද උපකාර කිරීම මෙහිදී සිදු වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහිදී සිදු වේ.


මේ යටතේ වෛද්‍ය ප්‍රතිකාර, සැත්කම්, පෝෂණ කටයුතු, ශාරීරික දුර්වලතා වෙනුවෙන් භාවිතා කරන උපකරණ සඳහා ආධාර සැපයීම සිදු කරනු ලබයි. ප්‍රතිකාර හා පෝෂණ කටයුතු වෙනුවෙන් රු.5000/- මුදලක් ද, සැත්කම් සඳහා රු.10,000/- ක මුදලක් ද, උපකරණ සඳහා ඒවායේ මිල ගණන් අනුව විවිධ ප්‍රමාණයේ මුදල් ගෙවීම ද සිදු වේ. මෙම ගෙවීම් ප්‍රමාණයන් එම දරුවන්ගේ පවුල් වල විවිධ ස්වභාවයන් හා ඔවුන් මුහුණ පා ඇති දුෂ්කරතාවයන් මත වෙනස් වීමට ද පුළුවන.

සෑම ඉල්ලුම්කරුවෙකුටම එක් අවස්ථාවක් පමණක් මෙම ආධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව වසරකට පවුල් 500 කට පමණ මෙමඟින් සහන සලසා දීමට අවස්ථාව ලැබී ඇත

**2017 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෛද්‍යාධාර ගෙවීම් සිදුකළ ආකාරය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල රු. | ළමුන් ගණන |
|---|---|---|---|
| 1 | කොළඹ | 25000.00 | 04 |
| 2 | ගම්පහ | 66000.00 | 11 |
| 3 | කළුතර | 30000.00 | 05 |
| 4 | ගාල්ල | 30000.00 | 05 |
| 5 | මාතර | 55000.00 | 8 |
| 6 | හම්බන්තොට | 20000.00 | 3 |
| 7 | මහනුවර | 40000.00 | 8 |
| 8 | මාතලේ | 55000.00 | 09 |
| 9 | නුවරඑළිය | 40000.00 | 08 |
| 10 | අනුරාධපුර | 50000.00 | 11 |
| 11 | පොළොන්නරුව | 20000.00 | 04 |
| 12 | මොණරාගල | 22500.00 | 03 |
| 13 | බදුල්ල | 30000.00 | 06 |
| 14 | කුරුණෑගල | 95000.00 | 16 |
| 15 | පුත්තලම | 10000.00 | 02 |
| 16 | කෑගල්ල | 20000.00 | 04 |
| 17 | රත්නපුර | 45000.00 | 07 |
| 18 | මුලතිව් | 0 | 00 |
| 19 | ත්‍රිකුණාමලය | 70000.00 | 16 |
| 20 | මන්නාරම | 20000.00 | 32 |

| | | | |
|---|---|---|---|
| 21 | මඩකලපුව | 50000.00 | 25 |
| 22 | වවුනියාව | 5000.00 | 1 |
| 23 | කිලිනොච්චි | 0 | 0 |
| 24 | අම්පාර | 45000.00 | 08 |
| 25 | යාපනය | 75000.00 | 15 |
| | **Total** | 918500.00 | 167 |





## 5.9 හදිසි විපත් ආධාර

හදිසියේ ඇති වන විපත් නිසා පවුල් වල අසරණ වන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා ලබා දෙන ආධාර ක්‍රමයකි. ක්ෂණිකව පරිසරයේ ඇතිවන ගංවතුර, සුළි සුළං, නාය යෑම්, නිවාස ගිනි ගැනීම්, වැනි තත්වයන් මත දුෂ්කරතාවයන්ට පත් වන දරුවන්ගේ සුභ සාධනය සැලසීම මෙහිදී සිදු වේ. එපමණක් ද නොව පවුල් තුළ දෙමව්පියන් මිය යෑම, දරුවන් අත්හැර දමා යෑම, දෙමව්පියන් හදිසි අනතුරු වලට රෝගාබාධ වලට ගොදුරු වීම, විදේශ ගතව නැවත නොපැමිණීම, දරුවන් තාවකාලික භාරකරුවන් අතට පත් වීම, එම භාරකරුවන් ශාරීරික හා මානසික දුර්වල අය වීම වැනි හේතූන් මත අසරණ වන දරුවන්ට පිහිට වීමට ද මෙම ආධාර ක්‍රමය උපකාරී වේ.

යම් ව්‍යසනකාරි තත්වයක දී දරුවන්ගේ පාසල් උපකරණ විනාශ වි ඇත්නම් ඒ වෙනුවෙන් එක් පවුලක් සඳහා රු. 5000/- ක ආධාරයක් ලබා දේ. එසේ වුව ද ඒ ඒ අවස්ථාවන්හි ඇති වන හානිදායක තත්වයේ ප්‍රබලතාවය මත ලබා දෙන ආධාර මුදල වෙනස් වීමට පුළුවන. කුමන හෝ ව්‍යසනකාරී තත්වයක දී වුවත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට දායකවීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහි දී සිදු වේ.

**2017 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් හදිසිවිපත් ගෙවීම් සිදුකළ ආකාරය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල | ළමුන් ගණන |
|---|---|---|---|
| 1 | කොළඹ | 58990.00 | 37 |
| 2 | ගම්පහ | 0 | 0 |
| 3 | කළුතර | 9510.00 | 1 |
| 4 | ගාල්ල | 0 | 0 |
| 5 | මාතර | 15000.00 | 1 |
| 6 | හම්බන්තොට | 10000.00 | 2 |
| 7 | මහනුවර | 20000.00 | 3 |
| 8 | මාතලේ | 10000.00 | 2 |
| 9 | නුවරඑළිය | 5000.00 | 1 |
| 10 | අනුරාධපුර | 10000.00 | 1 |
| 11 | පොළොන්නරුව | 12000.00 | 2 |
| 12 | මොණරාගල | 0 | 0 |
| 13 | බදුල්ල | 80000.00 | 2 |
| 14 | කුරුණෑගල | 10000.00 | 2 |
| 15 | පුත්තලම | 12000.00 | 2 |
| 16 | කෑගල්ල | 0 | 0 |
| 17 | රත්නපුර | 15000 | 3 |
| 18 | මුලතිව් | 0 | 0 |
| 19 | ත්‍රිකුණාමලය | 0 | 0 |
| 20 | මන්නාරම | 0 | 0 |
| 21 | මඩකලපුව | 0 | 0 |
| 22 | වවුනියාව | 0 | 0 |
| 23 | කිලිනොච්චි | 0 | 0 |
| 24 | අම්පාර | 15000 | 3 |
| 25 | යාපනය | 0 | 0 |
| | **එකතුව** | **210500.00** | **62** |




## 5.10 සෙනෙහස ඉතිරි කිරීමේ ගිණුම

සුනාමි ව්‍යසනයෙන් දෙමව්පියන් දෙදෙනාම අහිමි අවු.18ට අඩු දරුවන් සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි. 2006 වර්ෂයේ මෙම වැඩසටහන ආරම්භ වූ අතර එහි දී ළමුන් 689 දෙනෙකු ඇතුළත් විය. 2016 දෙසැම්බර් මාසය වන විට මෙහි සිටින ළමුන් සංඛ්‍යාව 52 ක් විය. සෑම මසකම අවු.18 සම්පූර්ණ වන ළමුන් මෙම වැඩසටහනින් ඉවත් වේ.

මෙම දෙපාර්තමේන්තුව මහජන බැංකු මූලස්ථානය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. සෑම මාසයකම අදාළ ළමුන් වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව මඟින් මහජන බැංකුව වෙත මුදල් (චෙක්පත් මඟින්) යැවීම සිදු කරයි.

වයස අවු.18 සම්පූර්ණ වන ළමුන් පිළිබඳව බැංකුව මඟින් දෙපාර්තමේන්තුව වෙත මාසිකව දැනුම් දෙනු ලබයි. බැංකුව මඟින් අදාළ ළමුන් වෙත මුදල් නිදහස් කර එම තොරතුරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිම සිදු වේ.

**2017වර්ෂයේ සෙනෙහස ගිණුමේ මුදල් වැය වූ ආකාරය**

| අනු අංකය | මාසය | ළමුන් සංඛ්‍යාව | වැය වූ මුදල ( රු. ) |
|---|---|---|---|
| **01** | ජනවාරි | 52 | 78000.00 |
| **02** | පෙබරවාරි | 52 | 78000.00 |
| **03** | මාර්තු | 52 | 78000.00 |
| **04** | අප්‍රේල් | 52 | 78000.00 |
| **05** | මැයි | 52 | 78000.00 |
| **06** | ජූනි | 52 | 78000.00 |
| **07** | ජූලි | 52 | 78000.00 |
| **08** | අගෝස්තු | 52 | 78000.00 |
| **09** | සැප්තැම්බර් | 52 | 78000.00 |
| **10** | ඔක්තෝම්බර් | 52 | 78000.00 |
| **11** | නොවැම්බර් | 51 | 76500.00 |
| **12** | දෙසැම්බර් | 51 | 76500.00 |
| | එකතුව | | 933000.00 |


## 5.11 ළමා සමාජ හා ළමා සභාව පිහිටුවීමේ ව්‍යාපෘතිය

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන්ව ඇති පරිදි 12,13,14 යන වගන්ති මගින් ආවරණය වන ළමයින්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කරමින් ළමයින් බලගැන්වීමේ ප්‍රධාන අරමුණින් යුතුව 2007 වර්ෂයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ළමා සමාජ පිහිටුවන ලදි. මෙසේ පිහිටුවා ගන්නා ලද ළමා සමාජ තුළින් දරුවන්ගේ සංවර්ධනයට, සාරධර්ම හා කුසලතා වර්ධනයට අදාළ විවිධ වැඩසටහන් රාශියක් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ක්‍රියාත්මක කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති ළමා සමාජ ඒකරාශී කරගනිමින් ප්‍රාදේශීය ළමා සභා ද, ප්‍රාදේශීය ළමා සභාවේ නිලධාරී මණ්ඩලයේ එකතුවෙන් දිස්ත්‍රික් ළමා සභා ද ,දිස්ත්‍රික් ළමා සභාවල එකතුවෙන් ජාතික ළමා සභාවක්ද ස්ථාපිත කර ඇත.

## ශ්‍රී ලංකාවේ ළමා සංවිධාන ව්‍යුහය

(ළමා සමාජ ළමා සභා ව්‍යුහය )




මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේදී පහත සඳහන් වැඩසටහන් සේව්ද විල්ඩ්‍රන් ආයතනය විසින් ලබා දී ඇති ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ අරමුදල මගින් ක්‍රියාත්මක කර ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ළමා සභා ශක්තිමත් කිරීම

ප්‍රාදේශීය/දිස්ත්‍රික් ළමා සභාවට අයත් ළමුන් රැස්කර වර්ෂයේ ක්‍රියාත්මක වන වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය/දිස්ත්‍රික් ළමා සභාව රැස් කිරීම ත්‍රෛමාසිකව සිදු වේ. එබැවින් ප්‍රාදේශිය සහ දිස්ත්‍රික් ළමා සභාවල ක්‍රියාත්මකභාවය වැඩිදියුණුවන ආකාරයට ඒවා පහසුකරණය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම පිණිස එක් ප්‍රාදේශිය/දිස්ත්‍රික් කාර්යාලයක් වෙනුවෙන් රු.10,000/-ක මුදලක් ලබා දී ඇත.

### 1. පහසුකරුවන් පුහුණු කිරීම

ශ්‍රී ලංකාවේ ළමා සභා ව්‍යුහය තුළ දරුවන්ගේ සහභාගීත්වය පිළිබඳ පර්යේෂණයේ නිර්දේශයන්ට අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම ළමා සමාජ ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ළමා සමාජ පහසුකරුවන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පහසුකරුවන් 20 බැගින් (නිළධාරීන් දෙදෙනෙකු සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පහසුකරුවන් 40 බැගින් ) සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

**2.** අර්ථාන්විත ළමා සහභාගීත්වය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩමුළුව

පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ළමුන්ගේ සහභාගීත්ව අයිතිය සහතික කිරීම සඳහා අර්ථාන්විත ළමා සහභාගීත්වය පිළිබඳ ජාතික මාර්ගොපදේශ සංග්‍රහයක් එළිදක්වා ඒ පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් නිලධාරීන් පුහුණු කර ඇත. ඒ අනුව මෙම පුහුණුකරුවන් මගින් ඒ ඒ දිස්ත්‍රික්කයන් තුළ රාජකාරී කරනු ලබන සියලුම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/සහකාරවරුන් සඳහා එම පුහුණුව ලබා දීමට ප්‍රතිපාදන ලබා දෙන ලදී

3.දරුවන්ගේ මූලිකත්වයෙන් කෙරෙන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබා දීම

ප්‍රදේශයේ යම් ගැටලුවක් හේතුවෙන් පීඩාවට පත්ව සිටින දරුවන්ට පොදුවේ හෝ දරුවන් කිහිප දෙනෙකු ඉලක්ක කරගෙන සෘජුවම එම දරුවන්ට ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික් ළමා සභාවක හෝ ප්‍රාදේශීය ළමා සභාවක දරුවන් විසින් කළ යෝජනා වෙනුවෙන් එක් දිස්ත්‍රික්කයක් සඳහා රු.40,000/- ක මුදලක් ලබා දෙන ලදී.

4.ජාතික ළමා සභාවේ දරුවන් සඳහා පෞරුෂ සංවර්ධන වැඩසටහන හා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන ළමුන්ගේ සහභාගීත්ව අයිතිය සහතික කිරීමේ සමාජ ව්‍යුහයේ ජාතික මට්ටමේ ඒකකය ජාතික ළමා සභාව වේ. 2016/2017 ජාතික ළමා සභාව සඳහා තෝරා පත් කරගත් ජාතික ළමා සභා දරුවන් වෙනුවෙන් නායකත්ව පුහුණු වැඩසටහනක් 2017.05.20 හා 21 දෙදින පිළියන්දල සුබෝධි ආයතනයේදී පහත සඳහන් අරමුණු පෙරදැරිව පවත්වන ලදී.

5.පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාර්ය පිළිබඳව අවබෝධයක් ලබා දීම

- ජාතික ළමා සභාව සක්‍රීය කිරීම
- දරුවන්ගේ ආකල්ප, කුසලතා වැඩිදියුණු කිරීම
- දරුවන් තුළ පෞරුෂ වර්ධනය ඇති කිරිම
- ළමුන්ගේ යුතුකම්, අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයක් ලබා දීම හා නායකත්ව හැකියාව වර්ධනය කිරිම
- ජාතික ළමා සභාවේ කමිටු පිළිබඳ විශේෂ දැනුමක් ලබා දීම
- මෙම දැනුම ග්‍රාමීය, ප්‍රාදේශීය මට්ටම දක්වා දරුවන් මගින් ව්‍යාප්ත කිරීම



**2017 ළමා සභා හා ළමා සමාජ වෙනුවෙන් ලබා දුන් ප්‍රතිපාදන**


| # | දිස්ත්‍රික්කය | වියදම (රු.) | | | |
|---|---|---|---|---|---|
| | | ළමා සභා/සමාජ රැස්වීම් පහසුකරණය | පහසුකරුවන් පුහුණු කිරීම | අර්ථාන්විත ළමා සහභාගීත්වය පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩමුළුව | දරුවන්ගේ මූලිකත්වයෙන් කෙරෙන වැඩසටහන් සඳහා |
| 1 | කොළඹ | 140,000 | 300,000 | 180,000 | - |
| 2 | කළුතර | 150,000 | 340,000 | 20,250 | 40,000 |
| 3 | ගම්පහ | 140,000 | 400,000 | 23,625 | 40,000 |
| 4 | මහනුවර | 210,000 | 520,000 | 30,375 | - |
| 5 | මාතලේ | 110,000 | 220,000 | 13,500 | - |
| 6 | නුවර එළිය | 60,000 | 160,000 | 10,125 | - |
| 7 | ගාල්ල | 200,000 | 420,000 | 24,750 | 40,000 |
| 8 | මාතර | 175,000 | 340,000 | 20,250 | - |
| 9 | හම්බන්තොට | 130,000 | 300,000 | 18,000 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | රත්නපුර | 180,000 | 340,000 | 20,250 | - |
| 11 | කෑගල්ල | 120,000 | 220,000 | 16,875 | 40,000 |
| 12 | අනුරාධපුර | 230,000 | 460,000 | 27,000 | - |
| 13 | පොළොන්න රුව | 80,000 | 180,000 | 11,250 | 40,000 |
| 14 | පුත්තලම | 170,000 | 320,000 | 19,125 | - |
| 15 | කුරුණෑගල | 310,000 | 800,000 | 46,125 | - |
| 16 | බදුල්ල | 150,000 | 320,000 | 20,250 | - |
| 17 | මොණරාගල | 120,000 | 220,000 | 13,500 | - |
| 18 | ත්‍රිකුණාමලය | 90,000 | 220,000 | - | - |
| 19 | අම්පාර | 210,000 | 400,000 | | - |
| 20 | මඩකලපුව | 140,000 | 300,000 | 50,625 | - |
| 21 | යාපනය | 150,000 | 320,000 | 39,375 | - |
| 22 | කිලිනොච්චි | 50,000 | 80,000 | - | - |
| 23 | මන්නාරම | 60,000 | 100,000 | - | - |
| 24 | මුලතිව් | 40,000 | 120,000 | - | - |
| 25 | වව්නියාව | 50,000 | 80,000 | - | - |
| | **එකතුව** | **3,465,000** | **7,540,000** | **443,250** | **200,000** |

**පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා සමාජ ගණන**

| | දිස්ත්‍රික්කය | 2017 ලියාපදිංචි ළමා සමාජ | ලියාපදිංචි මුළු ළමා සමාජ ගණන |
|---|---|---|---|
| 1 | කොළඹ | 12 | 215 |
| 2 | කළුතර | 16 | 193 |
| 3 | ගම්පහ | 24 | 302 |
| 4 | මහනුවර | 59 | 442 |
| 5 | මාතලේ | 27 | 165 |
| 6 | නුවර එළිය | 3 | 124 |
| 7 | ගාල්ල | 10 | 246 |
| 8 | මාතර | 10 | 192 |
| 9 | හම්බන්තොට | 8 | 205 |
| 10 | රත්නපුර | 27 | 215 |
| 11 | කෑගල්ල | 21 | 177 |
| 12 | අනුරාධපුර | 12 | 249 |
| 13 | පොලොන්නරුව | 0 | 66 |
| 14 | පුත්තලම | 37 | 201 |
| 15 | කුරුණෑගල | 41 | 587 |
| 16 | බදුල්ල | 5 | 145 |
| 17 | මොණරාගල | 0 | 164 |
| 18 | ත්‍රිකුණාමලය | 0 | 78 |
| 19 | අම්පාර | 8 | 131 |
| 20 | මඩකලපුව | 7 | 83 |
| 21 | යාපනය | 7 | 95 |
| 22 | කිලිනොච්චිය | 50 | 58 |
| 23 | මන්නාරම | 8 | 30 |
| 24 | මුලතිව් | 8 | 30 |
| 25 | වව්නියාව | 0 | 38 |
| එකතුව | | 400 | 4431 |

**2015 සිට 2017 දක්වා ළමා සමාජ ලියාපදිංචි වී ඇති අයුරු**




## 5.12 වීදි දරු සුභසාධන වැඩසටහන

ළමා අපයෝජනය අවම කර සුරක්ෂිත ළමා පරපුරක් ඇති කර ගැනීම සඳහා කටයුතු කිරීමේදී වීදි දරුවන්ගේ ආරක්ෂාව හා සුබ සාධනය සඳහා වැඩසටහන් පැවැත්වීම ඉතා වැදගත් වේ. මේ යටතේ කොළඹ, ගම්පහ, මහනුවර හා කතරගම ප්‍රදේශවල බහුලව ජීවත්වන වීදි දරුවන් පිළිබඳව සුබ සාධන වැඩ සටහන් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ සිදු කර ඇති අතර මේ තුළින් වීදි දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සුරක්ෂිත කිරීම, ළමුන්ගේ නිර්මාණශීලීත්වය, සැඟවුණු කුසලතා, තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරමින් පෞරුෂ හා නායකත්ව කුසලතා සංවර්ධනය සඳහා අතදීමට හැකි වී ඇත.

**වීදි දරු සුබ සාධන වැඩසටහන යටතේ 2017 වර්ෂයේ සිදු කළ කාර්යයන් හා ලබා දුන් ප්‍රතිපාදන**

| # | දිස්ත්‍රික්කය | වැඩ සටහන/කාර්යය | ලබා දුන් මුදල/වියදම (රු.) |
|---|---|---|---|
| 1 | කොළඹ | වීදි දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන්/භාරකරුවන් වෙනුවෙන් සායනයක් පැවැත්වීම | 30,000 |
| 2 | මොණරාගල | පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම | 30,000 |
| | | කතරගම වීදි දරු වැඩසටහන ප්‍රගති සමාලෝචනය | 13,949.86 |
| 3 | මහනුවර | වීදි දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන්/භාරකරුවන් වෙනුවෙන් සායනයක් පැවැත්වීම | 30,000 |
| | | මාවත්වාසී පවුල්වල දරුවන්ගේ පෞරුෂ සංවර්ධන වැඩමුළුව | 50,000 |
| 4 | ගම්පහ | වීදි දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන්/භාරකරුවන් වෙනුවෙන් සායනයක් පැවැත්වීම | 30,000 |
| එකතුව | | | 183,949.86 |

## 5.13 ආදර්ශ ළමා ගම්මාන වැඩසටහන - 2017

දරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ළමා ආදර්ශ ගම්මාන වැඩ සටහන ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ආදර්ශ ගම්මාන, දරුවන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නිර්මාණශීලි ලෙස ගොඩනගන ලද වැඩ සටහන් උපයෝගී කර ගනිමින්, ප්‍රජාවගේ ක්‍රියාකාරී මැදිහත්වීම සහිතව ක්‍රියාත්මක වේ. ළමා උපදේශක කමිටු නිලධාරීන්ගේ මැදිහත්වීම ද මෙම යාන්ත්‍රණය සවිමත් කිරීමට ඉවහල් වී ඇත.

දෙපාර්තමේන්තුව විසින් දරුවන් උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් මෙම ගම්මාන තුළ ඍජුව ම ක්‍රියාත්මක කළ හැකිය. දරුවන්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කිරීම අරමුණු කර ගනිමින් සිදු කරනු ලබන ළමා සමාජ වැඩ සටහන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් වැනි වැඩ සටහන් නිර්මාණශීලී ලෙස මෙම ගම්මාන තුළ සිදු කිරීමට මනා හැකියාවන් ඇත.

ආදර්ශ ළමා ගම්මාන හඳුනා ගැනීම සිදු කරනු ලබන්නේ ගමෙහි දරුවන් හට පවතින අවදානම් මට්ටම් අනුව වන අතර ප්‍රජාව ගේ ආධාරය සහ මැදිහත්වීම තුලින් දැනට ගම තුළ පවතින ක්‍රියා පිළිවෙල වෙනස් කිරීමේ ක්‍රියාවලියන් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ක්‍රියාවලිය එක් එක්

ගමෙහි පවතින ක්‍රියාපිළිවෙලට සුදුසු වන ලෙසින් සිදු කෙරේ. මෙම ක්‍රමවේදය තුළින් ප්‍රජාවගේ තීරණ හා අවශ්‍යතා මත පදනම් වූ විසඳුම් ලබා දීමට හැකියාව ලැබේ.

මෙම වසරේ දී මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම් සඳහා වන වැඩ සටහන් නිර්මාණශීලී ලෙස ආදර්ශ ගම්මානය තුළ සිදු කළ යුතුවේ. මෙම කාර්ය සඳහා සෑම ළමා හිමිකම් ප්‍රවර්ධන/සහකාර නිලධාරියෙකුටම රු.3000/- බැගින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

## 5.14 ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු වැඩසටහන

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි ලා ප්‍රජා පාදක සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීමත්, ශක්තිමත් කිරීමත් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කර ගෙන යනු ලබන කටයුතත්තකි. ඒ අනුව ළමා අයිතිවාසිකම් ප්‍රජාව අතරට රැගෙන යාම, ළමුන් විෂයෙහි ඇති ගැටළු සඳහා සාධනීය මැදිහත් වීමක් ලබා දීම, එම කාර්යයන් රජය ලෙස මෙහෙයුම් ක්‍රියාවලියට ඇතුළත් වීම වෙනුවෙන් ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු ක්‍රියාවලිය පවත්වා ගෙන යනු ලබයි.

මෙම වැඩ සටහන ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන සෑම පරිපාලන තලයකදිම නිලධාරීන් හා ප්‍රජාව සම්බන්ධ වෙමින් පවත්වා ගෙන යනු ලබන කමිටු ව්‍යුහයක් ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ දී සෑම ගමකටම ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු පිහිටුවා ඇත. ඒ සඳහා ව්‍යවස්ථාපිත කරුණු හා විධිමත් භාවයක් ඇති කිරිම උදෙසා ඉතා විධිමත් මාර්ගෝපදේශනයක් ද හඳුන්වා දී ඇත.එමෙන්ම ප්‍රාදේශීය මාර්ගෝපදේශනයක් ද හඳුන්වා දී ඇත. එමෙන්ම ප්‍රාදේශීය ලේකම්ගේ සහභාගීත්වයෙන් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව, දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව, පළාත් ළමා සංවර්ධන කමිටුව, හා ජාතික මෙහෙයුම් කමිටුව ලෙස මෙම කමිටු ක්‍රියාදාමය ව්‍යාප්ත වී ඇත. මෙම වැඩ සටහන සඳහා ඉතාම ශක්තිමත් පදනමක් සකස් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ද අනුමත කර ගෙන ඇති අතර ඊට සමගාමීව 01/2018 අංකයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මගින් සියළු රාජ්‍ය පාර්ශවකරුවන් වෙත චක්‍රලේඛයක් ද නිකුත් කර ඇත. මෙහි දී ඒ ඒ කමිටු තලයන් හි ව්‍යුහය, කාර්යභාරය ඉතා සුවිශේෂී ලෙස හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාවලිය යටතේ දිවයින පුරා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු 7000කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවා ඇති අතර, 331 ක් වූ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ප්‍රාදේශීය ළමා අයිතිවාසිකම් මෙහෙයුම් කමිටුව ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් සිදු කරනු ලබන අතර, දිසත්‍රික් 25 ආවරණය වන පරිදි එම කමිටුව ස්ථාපනය වී ඇත. 01/2018 චක්‍රලේඛය අනුව පළාත් ළමා සංවර්ධන කමිටුව ස්ථාපිත කළයුතු වූ අතර, මේ වන විට දකුණු පළාත්, මධ්‍යම, නැගෙණහිර පළාත් කමිටු පිහිටුවා ඇත. ජාතික කමිටුව ද ඉතා සක්‍රීය මට්ටමක පවතී. 2017 වර්ෂයේ දී මෙම කමිටු ක්‍රියාවලිය තුළ ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු සඳහා

නව මාර්ගෝපදේශය හඳුන්වාදීම සඳහා රුපියල් මිලියන 3.31ක වියදමක් දරණ ලද අතර, ප්‍රාදේශීය ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු වෙනුවෙන් රුපියල් මිලියන 2.33 ක් වැය කර තිබේ.

## 5.15 ළමා මිතුරු මධ්‍යස්ථාන

අවදානම් සහගත පවුල් පරිසරය තුළ හුදකලාවන දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් ඔවුන්, තමන්ගේ විවේක කාලය ආරක්ෂිතව ගත කිරීමට මෙම මධ්‍යස්ථානයන් හි අවශ්‍ය රැකවරණය ලබා දේ. දෙමාපියන්  දෙදෙනාම තම නිවෙස් වලින් බැහැරව කටයුතු කරන අවස්ථා වලදී දරුවන් ගේ ආරක්ෂාව මෙන්ම දැනුම, කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දේ. මෙහිදී පුස්තකාල, ගෘහස්ථ ක්‍රීඩා මෙන්ම බාහිර ක්‍රීඩා ක්‍රියාකාරකම් වල නිරත වීමේ භාග්‍යය ද මොවුන්ට ලැබේ.

## 5.16 දැනුවත් කිරීමේ වැඩසටහන්

සමාජය තුළ විෂමාකාර ගැටළුවලට මුහුණ දෙන දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධව විවිධ ක්‍රියාකාරකම් මගින් දරුවන් සවිබල ගැන්වීම මෙන්ම සමාජයේ විවිධ කොටස් දැනුවත් කරයි. ප්‍රදේශීය මට්ටමෙන් මෙන්ම දිස්ත්‍රික්ක පාදක කර ගනිමින් දරුවන් සඳහා බලපාන ගැටළු හඳුනා ගනිමින්, තම ගැටළු අවම කිරීම සඳහා  දරුවන්, දෙමාපියන්, ගුරුවරුන් මෙන්ම ග්‍රාමීය ජනතාවට අවශ්‍ය දැනුම ලබා දෙයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සේවය කරන නිලධාරීන් විසින් ඔවුන්ගේ කොට්ඨාශයට අදාළව පවතින ගැටළු පිළිබඳව විවිධ ව්‍යාපෘතීන් සකස් කර අප වෙත යොමු කරනු ලැබේ. එම ව්‍යාපෘතීන්ට අදාළව මෙන්ම දිස්ත්‍රික් ව්‍යාපෘතීන්ට අදාළව දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන මුදල් ලබා දෙනු ලැබේ.

ඒ අනුව 2017 වර්ෂය සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා රු.2630932.00 ක මුදලක් වැය කරන ලදී.

## 5.17 පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

විවිධාකාර  ගැටළු වලට බඳුන් වූ හා අපයෝජන සිදුවීමක් හෝ අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුවීම හේතුවෙන් මානසිකව පීඩාවට පත්ව ඇති දැරියන් සඳහා පමණක් උපදේශනය ලබා දීම සඳහා ස්ථාපිත කර ඇති ආයතනයකි.  මධ්‍යම රජය යටතේ ඇති පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අයත් එකම ආයතනය ද මෙය වේ.

අධිකරණ නියෝග මත යොමු කරන වයස 12-18 අතර දැරියන් පළාත් පරිවාස කොමසාරිස්ගේ නිර්දේශ මත මෙම ආයතනයෙ පුහුණුව සඳහා ඇතුළත් කරනු ලැබේ. මාස 06 ක කාල සීමාවක් සඳහා නේවාසික පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, දැරියන් 20 දෙනෙකු සඳහා පහසුකම් සපයා ඇත.

මෙම කාලය තුල දැරියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව, විධිමත් අධ්‍යාපනය නොලද අය වෙනුවෙන් නොවිධිමත් අධ්‍යාපනය ලබා දීමට කටයුතු කර ඇත. ඊට අමතරව මෙම පුහුණු කාලය තුල විනෝද චාරිකා,ආගමික වැඩ සටහන් මෙන්ම යෝගී වැඩ සටහන් පවත්වනු ඇත. මේ තුලින් දරුවන්ගේ මානසික ගැටළුවලට සහනයක් වනු ඇත.

දරුවන් වෙනුවෙන් ස්ථාපන කමිටු පවත්වා එහි තීරණ පරිදි දැරියන් දෙමව්පියන් වෙත හෝ භාරකරුවන් වෙත භාර දීමට කටයුතු කර ඇත.





## 5.18 ළමා නිවාස ගුණාත්මක තත්වයෙන් ඉහළ නැංවීම

දිවයිනේ සෑම පළාතකම පිහිටි රජයේ හා ලියාපදිංචි ස්වේච්ඡා ළමා නිවාසවල දරුවන්ගේ ආරක්ෂාව හා අවශ්‍යතාවයන් ගුණාත්මක භාවයකින් යුක්තව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යතාවයන් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් විසින් හඳුනාගෙන ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනා සඳහා අවශ්‍ය සහාය ලබා දීම මෙමගින් සිදු කෙරේ.

වාර්ෂිකව මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන හඳුනාගත් සංවර්ධන වැඩ සටහන් සම්බන්ධව යෝජනා සම්බන්ධයෙන් විමසා බැලීමකින් අනතුරුව එහි අවශ්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු

ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුගත මුදල සම්පූර්ණයෙන් හෝ ඇස්තමේන්තුගත මුදලින් කොටසක් පළාත් කොමසාරිස්වරුන් වෙත යොමු කරනු ලැබේ.

ඒ අනුව අදාළ ව්‍යාපාති නිසි පරිදි අවසන් කිරීමෙන් අනතුරුව අදාල බිල්පත් සහ වියදම් වාර්තා සහිතව අදාල ප්‍රගතිය ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කෙරේ.

ඒ අනුව 2017වර්ෂයේ දී මෙම වැය ශීර්ෂය යටතේ දිවයින පුරා පිහිටි ළමා නිවාස සහ පරත්ත ළමා පුහුණු උපදේශණ සේවා ජාතික මධ්‍යස්ථානය නවීකරණය සහ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.2,09,67,734.49 ක මුදලක් වැය කරණ ලදී.

## 5.19 ආයතනගත දරුවන්ගේ කුසලතා වර්ධනය

මෙම කාර්ය වෙනුවෙන් වෙන් වූ මුදල රුපියල් මිලියන 5.0 කි. පරත්ත ළමා පුහුණු හා උපදේශණ සේවා ජාතික මධ්‍යස්ථානයේ දරුවන්ට හා සෑම පළාතකම ළමා නිවාසගත දරුවන්ගේ සහජ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වැඩසටහනකි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් වෙත අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ළමා නිවාසවල දරුදැරියන් වෙත සෑම පළාතකම දරුවන් නියෝජනය වන පරිදි කුසලතා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීමට සුදුසු යෝජනා එවන ලෙස දන්වන ලදී. එම එවන ලද යෝජනා අතරින් දරුවන්ට සුදුසු වැඩ සටහන් තෝරා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන ලදි.

තවද, ළමා නිවාස ගත දරුවන් සමාජගත වන අවස්ථාව වන විට වෘත්තීයක නිරත කරවීමට සුදුසුකම් ලබා දීම අරමුණු කර ගෙන විවිධ වෘත්තීය පුහුණු ලබා දීම වෙනුවෙන් පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කර ඇති යෝජනා වලට අනුව රු.2547267.00ක ප්‍රතිපාදන මුදලක් ලබා දීමට කටයුතු කර ඇත.

## 5.20 ළමා නිවාස අධීක්ෂණය

මෙම වැය ශීර්ෂය යටතේ ළමා නිවාසවල දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම, ළමා නිවාසයට අවශ්‍ය ස්ථාවර වත්කම් සැපයීම හා ළමා නිවාස කාර්ය මණ්ඩල පුහුණු කිරීම් කටයුතු කර ඇත. එමෙන්ම ළමා නිවාස අධීක්ෂණය ද මෙමගින් කරන ලද කාර්යයකි. 2017 වර්ෂය තුල මේ සඳහා රු.5273660.28 ක මුදලක් වැය කර ඇත.

## 5.21 යුනිසෙෆ් ව්‍යාපෘතිය

මෙම දෙපාර්තමේන්තුව විසින් යුනිසෙෆ් ව්‍යාපාතිය හා ඒකාබද්ධව යුනිසෙෆ් ආයතනයේ මූල්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.

## 5.22 2017 ලෝක ළමා දිනය

සෑම වර්ෂයකම ඔක්තෝම්බර් 01 දිනයට යෙදෙන ලෝක ළමා දිනය සැමරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම 2017 වර්ෂයේ ලෝක ළමා දින ජාතික උත්සවය "මා පිය වැඩිහිටි සෙනෙහස රඳවමු - සොඳුරු ලොවක් වෙත දරුවන් කැඳවමු"යන තේමාව යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීය.

එසේම උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් සියළුම ද්විතීක පාසැල්වල වයස අවුරුදු 12-16 ත් අතර දරුවන් සඳහා ප්‍රජනන සෞඛ්‍ය හා යොවුන් වියේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් අප අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි මගින් සිදු කිරීමට කටයුතු කරණ ලදී. මේ සඳහා දරුවන් 100-125ත් අතර ප්‍රමාණයන් සහභාගි කර ගන්නා ලදී.

## 5.23 ළමා අපයෝජන පැමිණිලි පිළිබඳ තොරතුරු

ළමා අපයෝජන සම්බන්ධයෙන් 2017 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව වෙත නාමිකව, නිර්නාමිකව, ලිඛිතව සහ දුරකථනයෙන් පැමිණිලි 12093 ක් ලැබුණු අතර, එම සියළුම පැමිණිලි ඉදිරි විමර්ශන කටයුතු සඳහා සහ නීතිමය කටයුතු සඳහා විවිධ ආයතන වෙත යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර ඇත. මෙහි දී පැමිණිල්ලේ ස්වරූපය අනුව ප්‍රාදේශීය ලේකම්වරු හරහා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් වෙත ද, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය වෙත ද, අදාළ පොලිස් ස්ථාන වලට ද, කම්කරු දෙපාර්තමේන්තුව, පළාත් පරිවාස දෙපාර්තමේන්තු , විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ද යොමු කර ඇත. ඉතිරි පැමිණිලි සඳහා අවශ්‍ය උපදෙස් දුරකථනයෙන් ලබා දෙන ලදී.

| දිස්ත්‍රික්කය | ළමා අපයෝජනය පිළිබඳ වාර්තා වූ පැමිණිල්ලේ ස්වභාවය | | | | | | | | පැමිණිල්ලේ මූලාශ්‍රය (සංඛ්‍යාත්මකව) | | | | මුළු පැමිණිලි සංඛ්‍යාව | වර්තමාන තත්ත්වය (සංඛ්‍යාත්මක) | | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාසැල් නොයැවීම | බාල වයස් විවාහ/ගැබ් ගැනීම | කායික දණ්ඩණය | මානසික අපයෝජනය | ළමා ලිංගික අපයෝජන | නොසලකා හැරීම | ළමා මෙහෙකාර සේවය | වෙනත් | ප්‍රධාන කාර්යාලය මගින් | ජාතික ළමාරක්ෂක අධිකාරිය මගින් | දුරකථන ඇමතුම් මගින් | වෙනත් | | පූර්ණ කාලීන විසඳුම් ලබා දීම | කෙටිකාලීන විසඳුම් ලබා දීම | වෙනත් ආයතන වෙත යොමු කිරීම | |
| අම්පාර | 296 | 104 | 35 | 119 | 13 | 62 | 58 | 52 | 63 | 105 | 342 | 229 | **739** | 408 | 221 | 110 | 0 |
| අනුරාධපුරය | 99 | 26 | 39 | 20 | 5 | 51 | 3 | 5 | 6 | 68 | 54 | 120 | **248** | 117 | 73 | 55 | 3 |
| මඩකලපුව | 252 | 65 | 27 | 46 | 21 | 143 | 20 | 51 | 25 | 75 | 198 | 327 | **625** | 345 | 167 | 113 | 0 |
| බදුල්ල | 61 | 15 | 7 | 6 | 7 | 53 | 1 | 19 | 0 | 8 | 15 | 146 | **169** | 96 | 31 | 41 | 1 |
| කොළඹ | 819 | 15 | 39 | 123 | 23 | 54 | 15 | 99 | 37 | 57 | 172 | 921 | **1187** | 667 | 351 | 163 | 6 |
| ගාල්ල | 486 | 22 | 46 | 153 | 18 | 141 | 8 | 123 | 3 | 11 | 209 | 774 | **997** | 473 | 315 | 208 | 1 |
| ගම්පහ | 343 | 21 | 46 | 67 | 35 | 52 | 15 | 124 | 41 | 0 | 141 | 521 | **703** | 403 | 137 | 163 | 0 |
| හම්බන්තොට | 189 | 9 | 15 | 112 | 16 | 65 | 2 | 70 | 1 | 13 | 123 | 341 | **478** | 145 | 261 | 72 | 0 |
| යාපනය | 516 | 92 | 43 | 30 | 20 | 66 | 30 | 56 | 0 | 37 | 171 | 645 | **853** | 551 | 241 | 61 | 0 |
| කළුතර | 217 | 14 | 20 | 58 | 24 | 70 | 3 | 30 | 13 | 4 | 53 | 366 | **436** | 249 | 101 | 86 | 0 |
| මහනුවර | 204 | 3 | 8 | 12 | 13 | 62 | 0 | 17 | 11 | 14 | 27 | 267 | **319** | 110 | 105 | 104 | 0 |
| කෑගල්ල | 174 | 12 | 10 | 57 | 25 | 118 | 0 | 88 | 47 | 115 | 58 | 264 | **484** | 225 | 114 | 145 | 0 |
| කිලිනොච්චිය | 132 | 28 | 11 | 2 | 22 | 27 | 8 | 11 | 11 | 24 | 154 | 52 | **241** | 107 | 84 | 50 | 0 |
| කුරුණෑගල | 495 | 73 | 60 | 106 | 30 | 178 | 2 | 140 | 21 | 110 | 195 | 758 | **1084** | 664 | 271 | 149 | 0 |
| මන්නාරම | 119 | 27 | 20 | 15 | 8 | 11 | 2 | 53 | 34 | 41 | 53 | 127 | **255** | 156 | 58 | 41 | 0 |
| මාතලේ | 123 | 17 | 8 | 12 | 11 | 35 | 0 | 7 | 0 | 2 | 24 | 187 | **213** | 81 | 78 | 43 | 11 |
| මාතර | 409 | 13 | 28 | 103 | 17 | 192 | 1 | 75 | 94 | 71 | 102 | 571 | **838** | 463 | 272 | 103 | 0 |
| මොණරාගල | 10 | 1 | 6 | 5 | 2 | 7 | 0 | 6 | 0 | 1 | 11 | 25 | **37** | 21 | 5 | 11 | 0 |
| මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **0** | 0 | 0 | 0 | 0 |
| නුවරඑළිය | 77 | 7 | 11 | 42 | 5 | 62 | 2 | 11 | 20 | 5 | 50 | 142 | **217** | 125 | 57 | 34 | 1 |
| පොළොන්නරුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **0** | 0 | 0 | 0 | 0 |
| පුත්තලම | 231 | 30 | 11 | 14 | 26 | 44 | 2 | 117 | 11 | 2 | 115 | 347 | **475** | 168 | 194 | 112 | 1 |
| රත්නපුරය | 253 | 27 | 51 | 39 | 22 | 63 | 6 | 77 | 0 | 1 | 111 | 426 | **538** | 296 | 124 | 118 | 0 |
| වවුනියාව | 230 | 26 | 126 | 159 | 25 | 165 | 4 | 5 | 60 | 94 | 342 | 244 | **740** | 287 | 235 | 218 | 0 |
| ත්‍රිකුණාමලය | 127 | 13 | 27 | 0 | 10 | 24 | 15 | 1 | 0 | 6 | 91 | 120 | **217** | 75 | 74 | 68 | 0 |
| **එකතුව** | **5862** | **660** | **694** | **1300** | **398** | **1745** | **197** | **1237** | **498** | **864** | **2811** | **7920** | **12093** | **6232** | **3569** | **2268** | **24** |

## 5.24 ආරක්ෂණ සැලසුම් සකස් කිරීම

අවදානම් තත්වයේ පසුවන දරුවන් සඳහා දිගු කාලීනව ආරක්ෂාව සහතික කිරීමේ වැඩ පිළිවෙල ආරක්ෂණ සැලසුම් සකස් කිරීමයි. ළමා ආරක්ෂාව සහතික කිරීමේ ශිල්පීය ක්‍රමවේදයක් ලෙස මෙහි අවශ්‍යතාව මතු වන්නේ 2011 වර්ෂයේ දී දීප ව්‍යාප්තව කරන ලද අවදානම් සහිත ළමුන් හඳුනා ගැනීම පිළිබඳ වූ සමීක්ෂණය තුළින් විශාල ළමුන් සංඛ්‍යාවක් හඳුනා ගැනීමට ලැබීම හේතුවෙනි.


මේ ආකාරයට හඳුනා ගන්නා ලද දරුවන්ගේ අවදානම් තත්වයන් විවිධ විය. ඔවුන්ගේ අවදානම් තත්වයට අනුව එම අවදානම් තත්ත්වයෙන් අහෝසි කර ආරක්ෂාව සහතික කිරීම සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම සිදු කරයි. එය කෙටි කාලීනව මෙන්ම වසර කීපයක් පුරා දිගු කාලීනවද ක්‍රියාත්මක කිරීමට සිදුවන අතර ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.

මෙම ආරක්ෂණ සැලසුම් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම හා ඇගැයීම ඇතුළු සියළු කටයුතු වලදී වෙනත් ක්ෂේත්‍ර නිලධාරීන් ගේ සහය ද ලබා ගනු ලැබේ. ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ දී තනි පුද්ගලයකුට වඩා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ ක්‍රියා කිරීමේ ඇති වැදගත්කම මේ තුළින් අවධාරණය කර ඇත.

මෙම ආරක්ෂණ සැළසුම් සකස් කිරීම තුළින් දරුවාට ආරක්ෂාව සහ සංවර්ධනය ලැබෙන අතරම පවුල නගා සිටුවීම ද සිදුවෙයි. විශේෂයෙන් දරුවන්ගේ පෝෂණය හා සංවර්ධනයට අවශ්‍ය පවුලේ ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම් වර්ධනය මෙන්ම අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීම සඳහා ද අවශ්‍ය පහසුකම් සපයා දීමට මේ තුළින් හැකියාව ලැබී ඇත

**2017 වර්ෂයේ ආරක්ෂණ සැළසුම් සකස් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කළ ආකාරය පහත පරිදි වේ**

| අනු අංකය | දිස්ත්‍රික්කය | මූල්‍ය වියදම (රු) | සකස් කරන ආරක්ෂණ සැළසුම් සංඛ්‍යාව |
|---|---|---|---|
| | | | |
| 01 | කොළඹ | 1,984,436.00 | 180 |
| 02 | කළුතර | 1,709.239.00 | 192 |
| 03 | ගම්පහ | 1,230,502.00 | 184 |
| 04 | ගාල්ල | 1,431,491.00 | 320 |
| 05 | මාතර | 1,466,183.00 | 280 |
| 06 | හම්බන්තොට | 1.922,383.00 | 240 |
| | | | |
| 07 | බදුල්ල | 2,134,725.00 | 178 |
| 08 | මොණරාගල | 2.917,008.00 | 180 |
| 09 | කෑගල්ල | 1,267,830.00 | 118 |
| 10 | රත්නපුර | 597,347.00 | 118 |
| 11 | මහනුවර | 1,798,598.00 | 320 |
| 12 | නුවරඑළිය | 158,982.00 | 82 |
| | | | |
| 13 | මාතලේ | 1,357,889.00 | 95 |
| 14 | කුරුණෑගල | 2,627,959.00 | 521 |
| 15 | පුත්තලම | 1,222,685.00 | 152 |
| 16 | අනුරාධපුරය | 1,282,350.00 | 175 |
| 17 | පොලොන්නරුව | 143,050.00 | 62 |
| 18 | අම්පාර | 325,092.00 | 420 |
| 19 | ත්‍රිකුණාමලය | 1,471,085.00 | 58 |
| 20 | මඩකලපුව | 1,121,679.00 | 131 |
| 21 | යාපනය | 709,000.00 | 158 |
| 22 | මන්නාරම | 1,135,460.00 | 64 |
| 23 | වවුනියාව | 1,808,150.00 | 58 |
| 24 | මුලතිව් | 210,000.00 | 04 |
| 25 | කිලිනොච්චි | | 30 |
| | එකතුව | 32,033,123,.00 | 4320 |




## 5.25 ළමා මූලික පර්යේෂණය - Child – led Research

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ළමා සභා ළමා සමාජ වැඩ සටහන තවදුරටත් දරුවන් අතර ප්‍රචලිත කරමින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ඔවුනගේ දායකත්වය ලබා ගැනීම අරමුණු කොට ළමා මූලික පර්යේෂණ වැඩ සටහන මෙම දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ දී ක්‍රියාත්ම කරන ලදී. මෙම වැඩ සටහනෙහි ප්‍රථම අදියර යටතේ දිස්ත්‍රික් 11 ක් සඳහා ප්‍රතිපාදන ලබා දෙමින් තම දිස්ත්‍රික්කය තුළ දරුවන් පිළිබඳ ගැටළුවක් හඳුන් ගනිමින් පර්යේෂණයක් සිදු කෙරිණි.

මේ යටතේ මූලික වශයෙන් දිස්ත්‍රික් 12 ක දිස්ත්‍රික් ළමා සභා දරුවන් කැඳවා ළමා මූලික පර්යේෂණය සම්බන්ධයෙන් දෙදින වැඩ මුළුවක් පවත්වන ලදී. මෙම වැඩ මුළුවෙන් අනතුරුව එක් දිස්ත්‍රික්කයක් සඳහා රු.40,000/- ක මුදලක් බැගින් රු.444,000/-ක මුදලක් පර්යේෂණය ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දෙන ලදී.

මෙහි තෙවැනි පියවර ලෙස දරුවන් විසින් පර්යේෂණය තුලින් හඳුනා ගන්නා ලද ගැටළුව උචිත නිර්දේශයන් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව එක් දිස්ත්‍රික්කයක් සඳහා රු.50,000/-ක උපරිමයක මුදලක් ලබා දුනි. මේ යටතේ 2017 වර්ෂයේ දී රු.127,000/-ක මුදලක් යෝජිත ක්‍රියාකාරකම් සඳහා කොළඹ, මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික් සඳහා ලබා දීමට කටයුතු කෙරිණ.මෙම වැඩ සටහන් හි පසු විපරම් දිසත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි මගින් සිදු කරනු ලබයි. මෙම වැඩ සටහන යටතේ වැය කරන ලද මුළු මුදල - රු.921,752.00

## 5.26 දකුණු ආසියානු කලාපීය රටවල දරුවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා වන සංවිධානය සමග සම්බන්ධ වැඩ සටහන් (South Asia Initiatives End Violence Against Children –( SAIEVAC)

දකුණු ආසියානු කලාපීය රටවල වෙසෙන දරුවන්ගේ අයිතිවාසිකම් උපරිම අයුරින් සුරක්ෂිත කිරීම අරමුණු කර ගනිමින් සියළු හංසනයන්ගෙන් තොර සුරක්ෂිත සමාජ වටපිටාවක් කලාපීය වශයෙන් ගොඩනැංවීම උදෙසා පිහිටුවා ගෙන ඇති මෙම සංවිධානයේ ශ්‍රී ලංකාව ද සාමාජිකත්වය දරණු ලබයි. එහි නියෝජිත ආයතනය ලෙස කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය නම් කර ඇති අතර ක්‍රියාකාරී ආයතනය ලෙස පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

විවිධ විෂයන් සම්බන්ධයෙන් වන කලාපීය ක්‍රියාකාරී සැලැස්මවල් සකස් කිරීම සඳහා වන උද්දේශන ක්‍රියාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිලධාඝනි සහභාගී කරවීමත් එවැනි උද්දේශන සැසි මෙරට තුල පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම 2017 වර්ෂය තුල පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරණ ලදී. ඒ අනුව 2017 ජනවාරි 26 සහ 27 යන දෙදින තුල නේපාලයේ දී පැවැත්වූ ගඩොල් කර්මාන්තය තුල මානව සහ ළමා ශ්‍රමය මෙන්ම සතුන්ගේ සුභ සාධනය සම්බන්ධයෙන් වන විධායක කලාපීය ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා වූ සම්මේලනයට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කෙරිණි.

මීට අමතරව ළමා අපයෝජන, ළමා ලිංගික වෙළඳාම සහ අන්තර්ජාලය තුල දරුවන්ගේ සුරක්ෂිතාවය පිළිබඳ කලාපීය උපාය මාර්ගික සැලැස්ම විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ සැසිය 2017 අගෝස්තු 23 සහ 24 යන දෙදින තුල ශ්‍රී ලංකාවේදී පැවැත්විණි. මෙම සංවිධානයේ සාමාජික රටවල් නියෝජනය කරමින් නිලධාරීන් 42 ක් පමණ සහභාගි විය. ඒ සඳහා සියළුම සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් එම වැඩසටහන පරිවාස හ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මෙහි සමාරම්භක සැසියට ගරු කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය තුමිය චන්ද්‍රාණි බණ්ඩාර මැතිණිය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රානි සේනාරත්න මැතිණිය ද සහභාගි විය. මේ සඳහා පූර්ණ මූල්‍ය අනුග්‍රාහකත්වය දකුණු ආසියානු කලාපීය රටවල දරුවන්ට එරෙහි හිංසනය වැලැක්වීම සඳහා වන සංවිධානය විසින් දරණු ලැබීය.

## 5.27 කොමන් බොන්ඩ් ව්‍යාපෘතිය සඳහා ළමා සමාජ නියෝජිතයන් යොමු කිරීම

කොමන් බොන්ඩ් ව්‍යාපෘතිය ඇමරිකාවේ පිහිටි ටියුස්ඩේස් චිල්ඩ්රන් යන ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන අතර එහි මූලික අරමුණ වනුයේ යුද්ධයෙන් පීඩාවට පත් රටවල දරුවන්ගේ නායකත්ව, සංවර්ධනය සහ අධ්‍යාපනය නගා සිටුවමින් ඔවුන් සංහිඳියාව තුල ක්‍රියාකාරී නායකයන් ලෙස පුහුණු කරනු ලබයි. මේ සම්බන්ධයෙන් වන වැඩ මුළුවක් 2017 ජූලි මස ඇමරිකාවේ නිව්යෝක් නුවර දී වැවැත්විණ. ඒ සඳහා මෙවර යාපනය දිස්ත්‍රික් ළමා සභාවේ සාමාජික දරුවෙකු සහභාගි කරවීමට අවස්ථාව උදාවිය. මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණය සිදු කරමින් එම අත්දැකීම් ළමා සමාජ දරුවන් සමග බෙදා ගැනීමට අවශ්‍ය පසුබිම මෙම දෙපාර්තනේතුව විසින් සකස් කරන ලදී.

## 5.28 උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරිම

මෙම වැඩ සටහන සඳහා රු.මිලියන 01ක ප්‍රතිපාදන වෙන් කරණ ලදී.

- **යුද්ධයෙන් ආබාධිත වූ ද්‍රවිඩ ප්‍රජාව සඳහා කරන ලද වැඩ සටහන්:**
  01. Happy Family දැනුවත් කිරීමේ වැඩ සටහන් යුද්ධය හා සෘජුවම සම්බන්ධ වූ ළමා සොල්දාදුවන් සඳහා
  02. ස්වයං රැකියා, ආධාර, උපකරණ ලබා දීම
  03. උපදේශණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
  04. ළමා මිතුරු මධ්‍යස්ථාන ඉදි කිරීම
  05. ආධාර ලබා දීම (පාසැල් උපකරණ)
- **වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම:**

දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ පදනම මත මනා ආර්ථික කළමනාකරණය, යහපත් පවුල් සම්බන්ධතා මෙන්ම පවුලේ සෞඛ්‍ය සම්පන්න බව හා සනීපාරක්ෂාව සැළකිය හැකිය. ඒ අනුව වතු ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ පවුල් ඒකකයන් ශක්තිමත්ව ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු වී තිබේ.

එම යොමුවීම අනුව පහත සඳහන් ගැටළු ආමන්ත්‍රණය කර ගැනීම සඳහා නිර්මාණාත්මක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි වී ඇත.

01. සෞඛ්‍ය හා සනීපාරක්ෂක ගැටළු
02. ළමුන්ගේ අධ්‍යාපන අයිතිය පිළිබඳ ගැටළු
03. ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටළු
04. උපයන ධන නිසි ලෙස පරිහරණය නොකිරීමේ ගැටළු
05. මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇතිවන ගැටළු (පියා/මව)

මෙම ගැටළු පිළිබඳ අවධානය යොමු කරමින් ඔවුන්ට සුවිශේෂී වෘත්තිකයින් මගින් දැනුම ලබාදීම ඉතාමත් කාලෝචිතය. මෙම දැනුම ලබා දීම සඳහා වතු ප්‍රජාවගේ සක්‍රිය දායකත්වය ලබා ගනිමින් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩ සටහන් සඳහා රු.15,000.00 X 55 = රු.825000/- ප්‍රතිපාදන දායක කර ගන්නා ලදී.

- **පාසැල් උපකරණ ලබා දීම**

පහත සඳහන් නිර්ණායක යටතේ පාසැල් උපකරණ ලබා දෙන ලද අතර, එක් දරුවෙක් රු.1000.00ක වටිනාකමින් යුත් පාසැල් උපකරණ ලබා දෙන ලදී.

01. විවිධ හේතූන් මත පාසැල් නොයන දරුවන් නැවත පාසැල් ගත කිරීම සඳහා
02. කඩින් කඩ පාසැල් නොයන දරුවන් දිරිමත් කොට නැවත පාසැල් ගත කිරීම
03. මව්පියන් දෙදෙනාම නොමැති, දැඩි ආර්ථික අඩු පාඩුකම් මැද අධ්‍යාපනය හොඳින් හදාරන දරුවන් සඳහා (ප්‍රගති වාර්තාවේ පිටපතක් හෝ පාසැල් පංති භාර ගුරුතුමියගේ නිර්දේශය ඇතුළත් ලිපියක්)

04.මාතෘ මූලික පවුල්වල ජීවත්වන අඩු ආදායම්ලාභී දරුවන් සඳහා

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන | ඉල්ලීම කර ඇති ප්‍රා.ලේ.කාර්යාල ගණන | දරුවන් ගණන | අනුමත ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | අනුරාධපුරය | 22 | 09 | 384 | 66 |
| 02 | පොළොන්නරුව | 07 | 02 | 57 | 21 |
| 03 | කුරුණෑගල | 30 | 20 | 684 | 90 |
| 04 | මාතලේ | 11 | 06 | 231 | 33 |
| 05 | මහනුවර | 20 | 16 | 1138 | 60 |
| 06 | නුවරඑළිය | 05 | 01 | 22 | 15 |
| 07 | රත්නපුරය | 17 | 13 | 735 | 51 |
| 08 | කෑගල්ල | 11 | 03 | 162 | 33 |
| 09 | පුත්තලම | 16 | 11 | 900 | 48 |
| 10 | කොළඹ | 13 | 05 | 131 | 39 |
| 11 | ගම්පහ | 13 | 05 | 119 | 39 |
| 12 | කළුතර | 14 | 04 | 83 | 42 |
| 13 | හම්බන්තොට | 12 | 06 | 170 | 36 |
| 14 | මාතර | 16 | 09 | 670 | 48 |
| 15 | ගාල්ල | 19 | 04 | 240 | 57 |
| 16 | යාපනය | 15 | 08 | 608 | 45 |
| 17 | කිලිනොච්චිය | 04 | 02 | 77 | 12 |
| 18 | මුලතිව් | 06 | 04 | 806 | 18 |
| 19 | වව්නියාව | 04 | 01 | 60 | 12 |
| 20 | අම්පාර | 20 | 06 | 520 | 60 |
| 21 | ත්‍රිකුණාමලය | 11 | 01 | 352 | 33 |
| 22 | මන්නාරම | 05 | 02 | 61 | 15 |
| 23 | මඩකලපුව | 14 | 05 | 254 | 42 |
| 24 | බදුල්ල | 15 | 11 | 589 | 45 |
| 25 | මොණරාගල | 11 | 03 | 197 | 33 |
| | එකතුව | 331 | 158 | 9250 | 993 |